**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
----------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

වාර්තා කරන අස්ථිත්වය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් වූ ණයගැති හා ණයහිමි වටිනාකම් රු. 666,782 ක් අඩුවෙන් හා තවත් ව්‍යාපෘති 5 ක් වෙනුවෙන් වූ ණයගැති හා ණයහිමි වටිනාකම් රු. 428,736 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු. 2,630,098 ක් වූ වියදම් සහ සභාව සතු වාහන 10 ක, මහන මැෂින් හා උපාංග 29 ක සහ ලීබඩු උපකරණ 53 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයන් 18 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 9,647,005 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

**-------------------**

ආදායම් විෂයයන් තුනක එකතුව රු. 28,540,041 ක් වූ හිඟ ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**--------------------**

i. 2004 වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 2,395,947 ක ණය මුදල හා ඊට අදාළ රු. 2,491,784 ක් වූ පොලී මුදලින් කිසිඳු වාරිකයක් ගෙවීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

ii. සභාව විසින් රැස්කර ගෙන තිබුණු එකතුව රු. 408,882 ක් වූ විවිධ බදු වර්ග 02 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසානයේ විවිධ ණයහිමියන් වෙනුවෙන් සහ කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් පිළිවෙලින් රු. 6,195,744 ක් සහ රු. 28,507,908 ක ගෙවිය යුතු ශේෂයන් පැවතුණු අතර එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------**

එකතුව රු. 23,683,159 ක් වූ ඉඩම් වලට අදාළ හිමිකම් ඔප්පු, පැවරුම් නියෝග, බලපත්‍ර, එකතුව රු. 34,676 ක් වූ සභා තැන්පත් ශේෂයට අදාළ ලේඛනය සහ විස්තරාත්මක උපලේඛනය, එකතුව රු. 37,281,389 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 185 | ප්‍රාදේශීය සභා පොදු ගිණුමේ හා කර්මාන්ත ගිණුමේ පිළිවෙලින් රු. 1,985,113 ක හා රු. 3,135,863 ක අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් ශේෂ පැවතියද, ඒවා ආයෝජනය කිරීම කෙරෙහි සලකා බලා නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | |
| i. මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු. 3,149,446 ක තැන්පත් ශේෂ 06 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 371 | දෙන ලද කාර්යය නිමකල විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත්, 2012 සහ 2013 වර්ෂවල ලබාදී තිබුණු රු.168,649 ක අත්තිකාරම් මුදල් 2017 මැයි 12 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ඈ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 4.3 (අ) සහ (ඉ) වගන්ති | සභාවේ සේවයේ සිටි ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ සේවයෙන් පහ කරන ලද, ඉවත්ව ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 04 ක ගෙන් අයවිය යුතු එකතුව රු. 20,261 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**1.3.7 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

සභාව සතු කැබ් රථයක් සඳහා නව එන්ජිමක් සවිකර තිබූ නමුත් ලියාපදිංචි තොරතුරු නීත්‍යානුකූලව සංශෝධනය කරවාගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 14,023,232 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 7,033,766 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,989,466 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්ත වියදම, මුළු ආදායමින් සියයට 85 ක් තරම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව පෙන්නුම් කෙරුණි.

(ආ) සභාවේ ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ඉකුත් වර්ෂ දෙකේදී සහ සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් අඛණ්ඩව සැලකිය යුතු අගයන්ගෙන් වැඩිවී ඇති බව පෙන්නුම් කෙරේ.

(ඇ) ඉකුත් වර්ෂයේ අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 11,304,323 ක ඍණ අගයක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට එම ඍණ අගය රු. 49,936,511 ක් දක්වා වර්ධනය වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලෙහි රු. 38,632,188 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

(ඈ) 2004, 2005 වර්ෂයන්හි දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදල් වලට අදාලව ගිණුම්ගත නොකරන ලද රු. 42,464,461 ක පොලිය ගිණුම්ගත කිරීම සහ සමුච්චිත අරමුදලට බැර කර තිබූ රු. 5,515,970 ක ගමින් ගමට දොරින් දොරට කර්මාන්ත සඳහා ප්‍රදාන ලැබීම් නිවැරදි කිරීම යනාදී ගැලපීම් සමුච්චිත අරමුදල හරහා සිදු කිරීම සමුච්චිත අරමුදලේ හර ශේෂයරු. 49,936,511 දක්වා වර්ධනය වීමට හේතුවී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පහත දැක්වෙන පරිදි විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල් කළ මුළු පුනරාවර්තන ආදායම රු. මිලියන 46.78 ක් වූ අතර, එයින් රු. මිලියන 32.15ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 69 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම්වල එකතුව රු. මිලියන 14.29 ක් වූ අතර, එයින් රු. මිලියන 6.35 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 44 ක් පමණ විය.

### 2.3.2 වරිපනම් හා බදු

-----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආරම්භක හිඟය රු. 3,588,302 ක් වූ අතර, රු. 2,967,482 ක් බිල් කිරීම් සමඟ රු. 6,555,784 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ බිල්කිරීම් වලින් සියයට 66 ක් හා හිඟයෙන් සියයට 33 ක් අයවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු අගය රු. 3,314,958 ක් විය. එම හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු පැනවීම සඳහා වන තක්සේරුව අවම වශයෙන් වර්ෂ 05 කට වරක් සිදුකල යුතු වුවද, 2007 වර්ෂයේ තක්සේරුව මත 2016 වර්ෂයේදීද වරිපනම් අයකර තිබුණි.

### 2.3.3 බදුකුලී

-------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කඩ කාමර කුලී

------------------

i. සභාව සතු කඩ කාමර 246 කට අදාළව 2017 මාර්තු 31 දින වන විට රු. 819,177ක කඩ කාමර කුලී අයවීමට තිබුණි. හිඟකුලී සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර එම මුදල් දණ්ඩන කුලිය සමඟ අයකර ගැනීමට හෝ සන්තකය අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ii. 2010 දෙසැම්බර් 27 දිනැති දකුණු පළාත් පාලන කොමසාරිස්වරයාගේ දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කල යුතු වුවත්, සභාවට අයත් කඩ කාමර 283 හි ගිවිසුම් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

iii. සභාව සතු කඩ කාමර 30 කට අදාළව මාසික බිල්කිරීම් වර්ෂ කිහිපයක සිට නතර කර තිබුණු අතර, එම කඩ කාමර අලුත් වැඩියා කර හෝ අවශ්‍ය යටිතල පහසුකම් සලසා නැවත කුලියට ලබාදීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) නිවාස කුලී
-------------

සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස වෙනුවෙන් රු. 76,075 ක හිඟ කුලියක් පැවතුණද, එම මුදල අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 976,688 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 10,178,017 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වාහන කුලියට ලබාදීමේ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වාහන කුලිය රු. 516,030 ක් වූ අතර, ඊට 2014 සහ 2016 වර්ෂ වලට අදාළ එකතුව රු. 364,900 ක මුදලක් ද ඇතුළත්වී තිබුණි. මෙම මුදල් 2017 මැයි 31 දින වන විටද අයකරගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් භාවිතා කරන වාහන 15 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ටෙන්ඩර් තැන්පතු සහ විවිධ තැන්පතු ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඇ) ට්‍රැක්ටර් දෙකක් සහ විදුලි ජනන යන්ත්‍ර එකක් වෙන්දේසි කිරීමට 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් නිර්දේශ කර තිබුණද, 2017 මැයි 12 වන විටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------**

සභාවට අයත් ට්‍රැක්ටර් රථ දෙකක්, පැජරෝ රථයක්, කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රයක්, මෝටර් බෝට්ටු දෙකක්, රෙදි මහන උපකරණ හා උපාංග 29 ක් සහ 4' හා 2' ටියුබ් ලයිට් 172 ක් දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින නමුත් එම වත්කම් අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට බැහැර කරන කසළ හැර, දෛනිකව රැස් කරන ඉතිරි කසළ වසර 20 ක පමණ කාලයක සිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් උද්ධගන්ධර ප්‍රදේශයේ ඉඩමට අවිධිමත්ව බැහැර කරමින් පැවතුණි.

(ආ) කසළ මුදා හැර තිබූ භූමියෙහි එක් කොටසක වූ කසළ පිළිස්සීමට කටයුතු කර තිබුණු අතර එමඟින් පරිසරයට අහිතකර වායූන් මුදා හරින්නේද යන්න පිළිබඳව සොයා බලා නොතිබුණි. මෙම කටයුතු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි.

(ඇ) කසළ බැහැර කරන භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණු අතර, එම නිසා කසළ අංගනයට අලි ඇතුන්, ගවයන් හා අනෙකුත් වන සතුන් ඇතුළු වී තිබුණු අතර, බාහිර පාර්ශවයන් විසින්ද මෙම භූමියට කසළ බැහැර කර තිබුණි.

(ඈ) විකිරණශීලී අපද්‍රව්‍ය මගින් පරිසරයට මෙන්ම ජීවීන්ට ඇති විය හැකි අවදානම පිළිබඳව අවධානය යොමු නොකර, විවෘත භූමියට එම ද්‍රව්‍ය බැහැර කිරීමට සහ, කොම්පෝස්ට් නිෂ්පාදනාගාරය පිහිටි භූමියේ කොටසක රඳවා තැබීමට කටයුතු කර තිබුණි.

(ඉ) බැහැර කර තිබූ ප්ලාස්ටික් වීදුරු, මැටි භාජන, ටයර් සහ ආශ්‍රිත ස්ථාන කිහිපයකම ජලය එක් රැස් වී තිබූ අතර, එතුළින් මැසි මදුරුවන් ඇතුළු රෝග කාරක කෘමීන් බෝ වීමට ඉඩකඩ සැලසී තිබුණි.රෝග කාරක ව්‍යාප්තිය වැළැක්වීම සඳහා මැසි තෙල් ඉසීමට කටයුතු කර නොතිබුණු අතර, ප්‍රදේශය පුරා පවතින දුර්ගන්ධය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරු 10 ක පුරප්පාඩු 18 ක්ද, තවත් තනතුරු 10 ක අතිරික්ත සේවක සංඛ්‍යා 51 ක්ද විය. මෙම අතිරික්ත සේවකයින් 51 දෙනා අතුරින් 37 දෙනෙකු අනියම් පදනම මත බඳවා ගෙන තිබුණි. පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සහ අතිරික්ත සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 17 ක් සඳහා සලසා තිබුණු රු. 1,091,500 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරිකිරීම්ද, වියදම් විෂයයන් 06 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු. 1,010,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයන්ට මාරු කිරීම්ද, වියදම් විෂයයන් 02 ක අහිතකර විචලනය රු. 8,135,873 ක් වීම නිසා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය